# පුද්ගලික ජංගම ගිණුම - නියමයන් සහ කොන්දේසි

සෙලාන් බැන්ක් පී.එල්.සී.,

…………………… ශාඛාව,

## හිතවත් මහත්මයාණෙනි/මහත්මියණි,

මෙහි පහත දක්වා ඇති නියමයන් සහ කොන්දේසි මත ශ්‍රී ලංකා රුපියල් වලින් මා/අප නමින් ජංගම ගිණුමක් විවෘත කරන ලෙස ඉල්ලා සිටිමි/සිටිමු. සෙලාන් බැන්ක් පී.එල්.සී ("බැංකුව") විසින් මා/අප නමින් ගිණුමක්/ගිණුම් විවෘත කිරීම/පවත්නා ගිණුමක් දිගටම පවත්වාගෙන යාම හා මා/අප වෙත බැංකු පහසුකම් සැලසීම සැලකිල්ලට ගනිමින් මෙහි පහත දක්වා ඇති නියමයන් සහ කොන්දේසි වලින් බැඳී සිටීමට මම/අපි එකඟ වෙමි/වෙමු. බැංකුව හෝ එහි අනුප්‍රාප්තිකයන් හෝ පැවරුම්ලාභීන් හෝ විසින් එකී නමින්/නම් වලින් මින්මතු විවෘත කරනු ලබන හෝ දිගටම පවත්වාගෙන යනු ලබන, කවර හෝ ස්වභාවයක වූ එක් එක් හෝ සියලු ගිණුම් වලට මේ නියමයන් සහ කොන්දේසි අදාළ විය යුතුය.

නියමයන් සහ කොන්දේසි

එක් තැනැත්තකුට වැඩි සංඛ්‍යාවක් විසින් ගිණුමක් විවෘත කරනු ලබන අවස්ථාවකදී "මම", "මා" හෝ "මගේ" යන්න "අපි", "අප" හෝ "අපගේ" යනුවෙන් කියවිය යුතුය. නියමයන් සහ කොන්දේසි මගින් එක් එක් තැනැත්තා තනි තනිවද, එක් තැනැත්තකු හෝ එකකට වැඩි තැනැත්තන් හෝ සියලු තැනැත්තන් සාමූහිකවද බැඳෙන අතර හවුල් ගිණුම්කරුවන්ගේ සියලු එකඟතා, බැඳීම් සහ වගකීම්, හවුල් සහ වෙන් වෙන් වශයෙන් විය යුතුය.

**1. බැංකු ගිණුම්**

(a) මා විසින් ඒ සම්බන්ධයෙන් බැංකුවට ප්‍රතිවිරුද්ධ ලිඛිත දැනුම් දීමක් කරනු ලබන තෙක්, පහත දක්වා ඇති දේ සඳහා එනම්,

(i) චෙක්පත්, ගෙවීම් සඳහා ද, විනිමය බිල්පත්, පොරොන්දු නෝට්ටු, ස්ථාවර නියෝග සෘජු හර කිරීම්, තැපැල් සහ ටෙලි ග්‍රැෆික් මගින් මාරු කිරීම්, මිලදී ගැනීම්, සුරැකුම් පත් සහ විදේශීය ව්‍යවහාර මුදල් විකිණීම සඳහා ද ණය වශයෙන් හෝ අන්‍යාකාරයෙන් එකී ගිණුම් හර කිරීම් මගින් සිදු කරනු ලබන වෙනත් ගනුදෙනු සම්බන්ධයෙන්ද;

(ii) එකී ගිණුම/ගිණුම් වැසීම සඳහා වූ උපදෙස් ඇතුලුව, එකී ගිණුම/ගිණුම් සම්බන්ධයෙන් වෙනත් යම් උපදෙස් පිළිගැනීම පිළිබඳව ද;

බැංකුවට ලබා දී ඇති අත්සන් යෙදීමේ උපදෙස් වලට අනුකූලව සකස් කරන ලද හෝ බාර ගන්නා ලද අත්සන් යෙදූ උපදෙස් හෝ ලේඛන මත ක්‍රියා කිරීමට මම බැංකුවට බලය දෙමි.

(b) බැංකුවට, එහි පරම අභිමතය පරිදි මාහට චෙක්පොතක් නිකුත් කිරීම කළ හැකි වේ. එකී චෙක්පොත සියලු කල්හි සුරක්ෂිතව තබා ගැනීම පිළිබඳව වගකීම මා භාර ගන්නා අතරම එකී චෙක්පොත හෝ එහි ඇතුළත් යම් චෙක්පත් හෝ නැතිවුවහොත් හෝ සොරාගනු ලැබුවහොත් ඒ පිළිබඳ වහාම බැංකුවට දැනුම් දෙන බවටද පොරොන්දු වෙමි. අදාළ චෙක්පත මා අතින් නැති වූ විටෙක දී හෝ තත්කාර්ය සම්බන්ධයෙන් නීතියෙන් ඉඩදෙනු ලැබ බැංකුව එකඟ වූ වෙනත් යම් අවස්ථාවන්හිදී, ගෙවීම් නතර කිරීමේ (ලිඛිත හෝ වාචික) උපදෙස් මගෙන් ලබා ගැනීම, බැංකුව විසින් තම පරම අභිමතය පරිදි කළ හැකි බව ද මම පිළිගනිමි. යම් හෙයකින් බැංකුව එවැනි උපදෙස් මගෙන් හෝ මා යැයි උද්දේශිත වෙනත් යම් තැනැත්තකුගෙන්, ලබා ගන්නේ නම් හෝ එහි ප්‍රතිඵලයක් වශයෙන් හෝ ඒ හා සම්බන්ධිතව හෝ උපචිත වූද බැංකුව විසින් පනවනු ලබන්නා වූද බැංකුවේ නිල වෙබ් අඩවිය තුළ ප්‍රදර්ශනය කර ඇති

පරිදි යම් ගාස්තු (යම් නෛතික ගාස්තු ඇතුළුව) ගෙවීමට ද, යම් පාඩුවක්, අලාභ හානියක් හෝ පිරිවැයක් සම්බන්ධයෙන් හානිපූරණය කිරීමටද මම පොරොන්දු වෙමි.

(c) මගේ ඉහත සඳහන් ගිණුමක් හෝ කවර හෝ ගිණුමක් හෝ සම්බන්ධයෙන් පැන නගින යම් අයිරාවක් හෝ වෙනත් යම් පහසුකමක් සම්බන්ධයෙන් මා වගකීමෙන් බැඳෙන අතර ඒ සම්බන්ධයෙන් උපචිත වන කවර හෝ පොලියක් හෝ පොලී (වැල් පොලී ඇතුළුව), කොමිස් මුදල් සහ වෙනත් යම් බැංකු ගාස්තු, පිරිවැය සහ වියදම් (යම් නෛතික ගාස්තු ඇතුළුව), බැංකුව විසින් තම පරම අභිමතය පරිදි, කලින් කල තීරණය කරනු ලබන පරිදි වූ අනුපාතිකයන්ට අනුව එකී ගිණුම/ගිණුම් වලින් හර කිරීමට මම මෙමගින් බැංකුවට අවසර දෙමි. තවද, බැංකුව විසින් තම පරම අභිමතය පරිදි නියම කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණ, එය විසින් නියම කරනු ලැබිය හැකි වේලාවලදී සහ ආකාරයට බැංකුවට ගෙවීමට ද මම භාර ගනිමි.

(d) මට දැනුම් දීමක් නොමැතිව, බැංකුවේ නිල වෙබ් අඩවිය තුළ ප්‍රදර්ශනය කර ඇති පරිදි අවම ශේෂ අවශ්‍යතා වූ සිරිත් වශයෙන් අය කරනු ලබන බැංකු ගාස්තු සහ වෙනත් ගාස්තු සහ වියදම් අය කර ගැනීමට හෝ පැනවීමට බැංකුවට ඕනෑම වේලාවක හිමිකම ඇති අතර ඉහත සඳහන් ගිණුම හෝ කවර හෝ ගිණුමක් හෝ සම්බන්ධයෙන් හෝ බැංකුව විසින් මට සලසා දී ඇති වෙනත් යම් පහසුකමක් හෝ සම්බන්ධයෙන් බැංකුවේ අභිමතය පරිදි එකී කාරණා වෙනස් කිරීම සහ අදාළ ගිණුම/ගිණුම් බැංකුවේ සාමාන්‍ය බැංකු පටිපාටි වලට අනුකූලව හර කිරීම ද කරනු ලැබිය හැකිය. එකී ගාස්තු මගේ ඉහත ගිණුම හෝ සියලු ගිණුම් හෝ අවසන් වීමේදී මට ආපසු නොගෙවනු ලැබේ.

(e) ශ්‍රී ලංකාවේ කලින් කල බලාත්මකව පවතින නීති මගින්, ගෙවීම් පාලනය වන බව ද, ගෙවීම් කිරීම ගිණුම පවත්නා සෙලාන් බැංකු ශාඛාවේ දී පමණක් කරනු ලබන බවද මම දන්නෙමි. බැංකුව සෑහීමට පත්වන පරිදි අනන්‍යතාව පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීමට ද බැංකුව විසින් කලින් කල අය කරනු ලැබිය හැකි සිරිත් පරිදි වූ යම් ගාස්තු ගෙවීමට ද යටත්ව බැංකුවේ වෙනත් යම් ශාඛාවකින් වුවද මුදල් ඉවත් කර ගැනීමට ඉඩ දීම සඳහා බැංකුවට අභිමතය තිබේ. මගේ අත්සනින් නිකුත් කරනු ලබන චෙක්පත් අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් අරමුදල් පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු සැලසීමට මා මෙයින් පොරොන්දු වන අතර ගිණුමේ ප්‍රමාණවත් අරමුදල් නොතිබීමේ හේතුවෙන් නොගෙවනු ලබන චෙක්පත් සම්බන්ධයෙන් බැංකුවේ නිල වෙබ් අඩවිය තුළ ප්‍රදර්ශනය කර ඇති පරිදි ගාස්තු පැනවීමට බැංකුවට ඇති අයිතිය මම පිළිගනිමි. තව ද එකී ගාස්තු වෙනස් කිරීමට බැංකුවට අභිමතය ඇති බවද මම පිළිගනිමි.

(f) විදේශීය ව්‍යවහාර මුදල් සමග කරන ගනුදෙනු හා ආශ්‍රිත අවදානමක් තිබෙන බව මා පිළිගන්නා අතර එවැනි අවදානම් සම්බන්ධයෙන් සහ එකී ගනුදෙනු පිළිබඳව කවර හෝ අන්දමකින් පැන නගින්නා වූ පිරිවැය සහ වියදම් සම්බන්ධයෙන් ද (ජාත්‍යන්තර හෝ දේශීය නෛතික හෝ නියාමන සීමා කිරීම්, සීමා වලින් තොරව ඇතුළත්ව) මා තනිව වගකීමෙන් බැඳෙන බව ද මම පිළිගනිමි.

(g) ජංගම ගිණුම් විවෘත කරන අවස්ථාවකදී එකී ගිණුම් විවෘත කරනු ලැබූ ශාඛාව විසින් මට දෙනු ලැබූ උපදෙස් පරිදි ජංගම ගිණුම් සඳහා යටත් පිරිසෙයින් එක් මසකට වරක් හෝ (අවුරුද්දක් හෝ ඊට වැඩි කාලයක් අක්‍රියව පවතින ගිණුම් සම්බන්ධයෙන්, බැංකුවේ තනි මතය පරිදි, අක්‍රිය අවුරුදු 06 ක කාල පරිච්ඡේදයකට සීමා වූ කාලය ඇතුළත මාස හයකට (6) වරක් බැංකුව විසින් එකී ප්‍රකාශ යැවීමට හෝ භාරදීමට යටත්ව) නොඑසේනම්, එක් එක් කාරණය සම්බන්ධයෙන්, කලින් කල බැංකුව හා මා එකඟ වනු ලබන පරිදි අන්‍යවූ කාලාන්තර වලදී බැංකුව විසින් මට ගිණුම් ප්‍රකාශ එවන බව හෝ බාරදෙනු ලබන බව දනිමි. එසේම එකී ප්‍රකාශ වල ඇතුළත් සියලු සටහන්ගත කරුණු වහා පරීක්ෂා කොට බැලීම පිළිබඳ මා තනි වගකීම දරන බවටද මගේ මතය අනුව එවැනි යම් ප්‍රකාශයක් සහ මා විසින් පවත්වාගන යන පුද්ගලික සටහන් අතර යම් ගැටීමක් ඇත්නම් ඒ බව එකී ප්‍රකාශයේ දින සිට දින 14 ක් ඇතුළත (4 වන ඡේදයේ විධිවිධාන වල කුමක් සඳහන් වුවද) ඒ බව ලිඛිතව බැංකුවට දැනුම් දිය යුතු බවටද මම එකඟ වෙමි.

මා විසින් එබඳු දැනුම් දීමක් නොකරනු ලැබුවේ නම්, අදාළ ගිණුම් ප්‍රකාශයේ නිවැරදිතාවය පිළිබඳ (සියලු කාර්යය සඳහා) මා එකඟ වී මා විසින් එය අවසානාත්මකව සහතික කළ බවට සළකනු ලැබිය යුතුය. ඉහත කිසිවකට අගතියක් නොවන පරිදි, සහ මේ සම්බන්ධයෙන් බැංකුව මත කවර හෝ බැඳීමක් නොපනවමින්, එකී ගිණුම් ප්‍රකාශයේ යම් වරදක් බැංකුව විසින් පසුකාලීනව සොයාගනු ලැබුවහොත්, බැංකුව විසින් එකී වරද සොයාගනු ලැබූ පසු ප්‍රායෝගිකව හැකි පහසු ඉක්මණින්, අදාළ පරිදි මගේ ගිණුමට හර කිරීමෙන් හෝ බැර කිරීමෙන් එකී වරද නිවැරද කරනු ලැබිය හැකියි.

(h) ඉහත සඳහන් කාරණයට අදාළව වෙනත් යම් බැංකු වලින් සිදු කරනු ලබන විමසීම් වලට ප්‍රතිචාර දැක්විය යුතු බව බැංකුව අදහස් කරන්නේ නම්, ඒ පිළිබඳ මගෙන් නොවිමසා සුදුසු ප්‍රතිචාර දැක්වීමට මම බැංකුවට අවසර දෙමි.

(¡) බැංකුවට පූර්ව ලිඛිත දැන්වීමක් මගින් මගේ කවර හෝ බැංකු ගිණුමක් වසා දැමීමට හැකි බව මම දනිමි. කෙසේ වුවද බැංකුව විසින් තමන්ගේම මෙහෙයවීමෙන් මා හට පූර්ව දැනුම් දීමක් කර හෝ යම් අධිකරණයක හෝ පරිපාලන නියෝගයක් මෙහෙයවීමෙන් හෝ අන්‍යාකාරයකින්, ඉහත ගිණුම් සමග ගනුදෙනු කිරීම, පූර්ව දැනුම් දීමකින් තොරව හෝ මා කෙරෙහි එයට (බැංකුවට) ඇති කවර හෝ යුතුකමක් කඩ කිරීම සම්බන්ධයෙන් වගකීමෙන් නොබැඳී වැසීම, තහනම් කිරීම හෝ අත්හිටුවීම කළ හැකිවේ.

(j) ඉහත සඳහන් කවර හෝ ගිණුමක් පිළිබඳ වූ ගනුදෙනුවකට අදාළව මගේ මරණය, අශක්නුතාව හෝ බුන්වත්භාවය (හෝ එවැනි සිද්ධියක් පිළිබඳ වූ යම් දැන්වීමක්) අදාළ ලේඛනගත සාක්ෂි සමග ඉදිරිපත් කරන්නේ නම් මිස ඒ හේතුවෙන් ඇතිවන පාඩුවක් සම්බන්ධයෙන් බැංකුව වගකියනු නොලැබේ. තවද, සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් රජයේ හෝ රජයේ යම් අනුයෝජ්‍යායතනයක ක්‍රියා හෝ බැංකුවේ පාලනයෙන් තොර (වැඩ වර්ජන, කාර්මික ක්‍රියා, උපකරණ වල ක්‍රියා විරහිත වීම්, විදුලි බල බිඳ වැටීම් වැනි දෑ ඇතුළුව, එහෙත් ඒවාට සීමා නොවූ) වෙනත් යම් ක්‍රියාවන් හේතුවෙන් ඇතිවිය හැකි යම් පාඩු, අලාභහානි හෝ ප්‍රමාද වීම් සම්බන්ධයෙන් බැංකුව වගකියනු නොලැබේ. කෙසේවුවද, ඉහත සඳහන් කවර හෝ හේතුවක් නිසාවෙන් සිදුවිය හැකි යම් ප්‍රමාද වීම් පිළිබඳව ඒ සෑම අවස්ථාවකදීම තම ශාඛාවල හෝ අන්‍යාකාරයෙන් ඒ පිළිබඳව තම ගනුදෙනු කරුවන්ට දැනුම්දීමට බැංකුව හැකි උත්සාහයන් දරනු ලැබේ.

(k) අපගෙන් එක් තැනැත්තකුගේ හෝ කවර හෝ තැනැත්තකුගේ හෝ මරණයේදී ලියුමක්, කරන ලද යම් වෙනසක්, ඔඩපනයක්, හිලව් කිරීමක්, ප්‍රතියාචනයක් හෝ අන්‍ය වූ කවර හෝ දෙයක් තුළින් ඔබට පැන නැගිය හැකි වූ යම් අයිතියකට හෝ ජීවත්ව සිටින්නන් නොවන්නා වූ වෙනත් යම් තැනැත්තකුගේ ඉල්ලීමක් හේතුවෙන් සුදුසු යයි ඔබ විසින් සලකනු ලබන යම් පියවරකට අගතියක් නොවන පරිදි අපගේ හවුල් නමින් පවත්නා යම් ගිණුමක් හෝ ගිණුම්වල බැරට පවත්නා යම් ශේෂයක් හෝ ශේෂ කිසිවක් ජීවත්ව සිටින්නන්ගේ අනුපිළිවෙලට දැරීම.

(l) මගේ යම් ගිණුමක් අවුරුදු දෙකක (02) කාලයක් ක්‍රියාත්මකව නොපැවතුනහොත්, සද්භාවය ස්ථාපිත කරන තෙක්, බැංකුව විසින් මගේ ගිණුම් අක්‍රිය හෝ ආපසු ගැනීම් සීමා කිරීම් වශයෙන් වර්ග කරනු ලැබිය හැකි බව මම දනිමි.

(m) යම් ගිණුමක් අවුරුදු 10 ක කාලයක් ක්‍රියාත්මකව නොපැවතුනහොත් එකී ගිණුම, පවත්නා නියෝග යටතේ හිමිකම් පෑමක් නොකරනු ලැබූ ගිණුමක් ලෙස වර්ග කරනු ලබන අතර "අත්හැරදැමූ දේපල" ලෙස මාරු කරනු ලැබේ.

(n) යම් ගිණුමක් අවුරුදු 2 ක කාලයක් ක්‍රියාත්මකව නොපැවතුනහොත් සහ එකී ශේෂය එකී අදාළ නිශ්පාදනය සඳහා නිශචිතව සඳහන් අවමයට අඩු වුවහොත්, බැංකුව විසින් එකී ගිණුම දින 14 ක දැන්වීමක් දීමෙන් පසු වසා දමනු ලැබේ.

**2. විදේශීය ව්‍යවහාර මුදල් අවදානම් හෙළිදරව් කිරීම.**

විදේශීය ව්‍යවහාර මුදල් ගනුදෙනු හා සම්බන්ධිත පාඩු ඇතිවීමේ අවදානම පිළිබඳව මා සම්පූර්ණයෙන් දැනුවත්ව සිටින බවද, ඒ හා සම්බන්ධව පවතින මූල්‍යමය සහ වෙනත් අවදානම් උපකල්පනය කිරීමට මා සූදනම් බව සහ එසේ කිරීමට මට හැකියාව ඇති බවද ඒ සම්බන්ධයෙන් මට උපචිත විය හැකි කවර හෝ පාඩුවක් සඳහා බැංකුව වගකීමෙන් බැඳීමක් මා නොකරන බව ද මෙයින් ප්‍රකාශ කරමි.

4. හවුල්/ඒකාබද්ධ ගිණුම්

(a ) අපගෙන් කෙනෙකුට හෝ අප සියලු දෙනාට හෝ (එක් අයකුට වඩා සිටිනම්) ගෙවිය යුතු හෝ අයත් බවට උද්දේශිත යම් හෝ සියලු චෙක්පත්, නෝට්ටු හෝ මුදල් ගෙවීම සඳහා වූ වෙනත් සාධන පත්‍ර තැන්පත් කිරීම සඳහා පිටසන් කිරීමට ද, බැංකුව වෙත තැන්පත් කිරීමටද අප එක් එක් අය විසින් එකිනෙකාට අවසරය සහ බලය දෙන අතර යම් හෙයකින් එවැනි යම් සාධන පත්‍රයක් එලෙස පිටසන් යෙදීමෙන් තොරව බැංකුවට ලැබුණේ නම්, අප වෙනුවෙන් එකී සාධන පත්‍රය පිටසන් කොට එය අදාළ ගිණුමට බැර කිරීමට බැංකුවට අපි මෙයින් බලය දෙමු.

(b) ගිණුම් දරන්නා සමන්විත වන්නේ කවර පුද්ගලයන්ගෙන් ද, එකී කවර හෝ පුද්ගලයකුගේ මරණය හෝ නෛතික අශක්නුතාවකදී, එකී හවුල් පාර්ශවකරුවන්ගේ බැරට ඇති මුදල් ගිණුම ක්‍රියාත්මක කිරීමට දී ඇති උපදෙස් ප්‍රකාර ගෙවීම සම්බන්ධයෙන්, බැංකුව වග කියනු නොලැබේ.

(c) ගිණුම මත හෝ අන්‍යාකාරයන් හෝ උපචිත වන අයිරාවක් හෝ වෙනත් යම් බැඳීමක්, එක් එක් සහ සෑම ඒකාබද්ධ ගිණුම් දරන්නකුගේ හවුල් සහ වෙන් වෙන් වගකීම විය යුතුය.

**3. බැංකුකරණ පහසුකම්**

(a ) පහසුකම, බැංකුව විසින් මේ ඉල්ලුම් පත්‍රය භාරගනු ලැබූ දින සිට බැංකුව විසින් ගෙවීම් ඉල්ලා සිටිනු ලබන

දින තෙක් මගේ උපයෝගිතාව සඳහා සුදනම්ව පවතී. කෙසේ වුවද, බැංකුව විසින් මට දන්වනු ලැබිය හැකි කවර හෝ දිනකදී, පහසුකම ප්‍රතිශෝධනය කිරීමේ අයිතිය, එය තමා වෙත රඳවා ගනී. පහසුකම ණයක් වන විටදී (මේ ඉල්ලුම් පත්‍රයේ ඇතුළත් කොට ඇති පරිදි), බැංකුව විසින් එය ආපසු ගෙවන ලෙස ඉල්ලීම් කරන තෙක්, එවැනි කවර හෝ පහසුකමක්, මේ ඉල්ලුම් පත්‍රයේ දක්වා ඇති ප්‍රමාණ වලින් සහ කාල වකවානුවලදී ගණුදෙනුකරුට ආපසු ගෙවිය හැකි අතර (හිලවු කිරීම් හෝ අඩු කිරීම් රහිතව) ව්‍යාපාරික දිනයක් නොවන යම් දිනකදී ගෙවිය යුතු වන යම් මුදලක් සම්බන්ධයෙන්, ඊළඟට එළඹෙන ප්‍රථම ව්‍යාපාරික දිනයේදී එය ගෙවිය යුතු වන අතරම, නීතිය මගින් යම් අඩු කිරීම් හෝ රඳවා ගැනීම් අවශ්‍ය කරනු ලබන විටදී, එකී අදාළ අඩු කිරීම් හෝ රඳවා ගැනීම් කිරීමෙන් පසු, එකී අඩු කිරීම් හෝ රඳවා ගැනීම් නොවන්නට බැංකුවට ලැබිය යුතු වන ශුද්ධ මුදල් ප්‍රමාණය බැංකුවට ලැබෙන බව සහතික කිරීම සඳහා අදාළ ගෙවීම අදාළ පරිදි වැඩි කිරීමට මම/අපි වග බලා ගනිමු.

(b) මා පහසුකම භාවිත කිරීම සම්බන්ධයෙන් බැංකුවේ ඒ වනවිට පවත්නා ණයට දීමේ අනුපාතිකයට අනුකූලව බැංකුව විසින් හර කරනු ලබන මගේ ගිණුමේ දිනපතා පවත්නා නොගෙවූ ශේෂය මත, වසරකට දින 365 කි යන්න මත පදනම්ව, පහසුකමට අදාළ පොලිය උපචිත විය යුතුය. ඉහත කී ණයට දීමේ අනුපාතික දැනුම්දීමකින් තොරව අඩු වැඩි වීමට යටත් වන බව මම පිළිගනිමි.

එක් එක් මාසයේ අවසාන ව්‍යාපාරික දිනයේ දී පොළිය (ප්‍රමාද ගෙවීම් සඳහා වූ පොළී ඇතුළුව) මගේ ගිණුමෙන් අය කරනු ලැබේ.

පහසුකම සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයන් එහි ගෙවීම් කිරීමට යෙදී ඇති දිනයේදී බැංකුවට ගෙවීමට මා අපොහොසත් වුවහොත්, වැඩ පිළිවෙලක් සකසා නොමැති අයිරා සඳහා එවකට පවතින බැංකුවේ අනුපාතිකයන් මත, ගෙවිය යුතු සියලු මුදල් ප්‍රමාණයන් සඳහා ප්‍රමාද ගාස්තු සම්බන්ධයෙන් මම බැංකුවට පොළිය ගෙවමි.

(c) පහසුකම සම්බන්ධයෙන් මා විසින් ගෙවනු ලැබීමට නියමිත සියලු ගෙවීම්, එය ගෙවීමට නියමිතව ඇති දිනයේදී මා විසින් ගෙවනු ලබන අතර පොළී (ප්‍රමාද ගෙවීම් සඳහා වූ ඒවාද ඇතුළුව), ගාස්තු සහ වියදම් (ණයගැති භාවය ඇතුළුව), ඇතුළු පහසුකම් සම්බන්ධයෙන් මා විසින් ගෙවිය යුතු සියලු මුදල් ප්‍රමාණයන් මගේ ගිණුමට හර කිරීම සඳහා මම බැංකුවට අවලංගු කළ නොහැකි ලෙස බලය දෙමි. එසේවුවද, එකී ගෙවීම් මගෙන් බැංකුවට ලැබිය යුතු සහ මා විසින් බැංකුවට ගෙවිය යුතු දිනයකදී සම්පූර්ණයෙන් ගෙවීම

සඳහා, ඉහත කී මාගේ ගිණුම්වල ඇති එකතු මුදල් ප්‍රමාණයන් ප්‍රමාණවත් නොවන්නේ නම්, එකී (ශේෂවූ) ප්‍රමාණය සම්පූර්ණ වශයෙන් ගෙවීමට මා බැංකුවට බැඳී ඇති බව පිළිගනිමි.

(d) යම් පහසුකමක් හා සම්බන්ධිත කාර්යය සඳහා මා විසින් සිදු කරනු ලබන ගෙවීම් ඇතුළත් කිරීම පිණිස හා සටහන්ගත කිරීම පිණිස මගේ ණයවර/අයිරා ගිණුම/ගිණුම්වලට අමතරව යම් වැඩිමනත් ගිණුමක් විවෘත කොට පවත්වාගෙන යාමට බැංකුවට (එහි පරම අභිමතය පරිදි) මෙයින් බලය ලබාදෙන අතර, එකී වැඩිමනත් ගිණුමෙහි/ගිණුම්වල පෙන්නුම් කරන ශේෂයන් සමග, ඉහත කී ණය/අයිරා ගිණුමෙහි පවත්නා ශේෂය සංයෝජනය කිරීමට සහ ඒකාබද්ධ කිරීමට ද බලය දෙමි. එමගින් ඇතිවන සංයෝජිත ශේෂය, බැංකුවේ සියලු කාර්ය සඳහා, කලින් කල මා විසින් බැංකුවට ඇති වගකීම සත්‍ය ලෙස නියෝජනය කරමින් ඒ පිළිබඳ මා වගකීමෙන් බඳිනු ලබන ප්‍රකාශයක් විය යුතුය.

(e) යම් වේලාවකදී, මෙහි විධිවිධාන කවර හෝ ආකාරයකින් නීති විරෝධී වුවහොත්, අවලංගු වුවහොත් හෝ බලාත්මක කිරීමට නොහැකි වුවහොත් ඉතිරි විධිවිධාන වල නීත්‍යානුකූලභාවය, වලංගුභාවය හෝ බලාත්මක කිරීමේ හැකියාවට එයින් බලපෑමක් නොසිදුවිය යුතු අතර, ඒවායේ අපචය වීමක්ද සිදුනොවිය යුතුය.

**4. හිලවු කිරීම සහ ඒකාබද්ධ කිරීමේ අයිතිය**

බැංකුව විසින් කවර හෝ වේලාවක හෝ කලින් කල දැනුම්දීමකින් තොරව, මගේ සියලු ගිණුම් සහ වගකීම් වෙනත් තැනැත්තකුගේ එවැනි ගිණුම් සහ වගකීම් සමග සංයෝජනය කිරීම හෝ කවර හෝ අතිරේක ගිණුමක බැරට ඇති සියලු හෝ යම් මුදල් වෙනත් තැනැත්තකු සමග තනිව හෝ ඒකාබද්ධව හිලවු කිරීමට ද බැංකුවට කළ හැකි අතර, එවකට පවත්නා ඔබගේම (බැංකුවේම) විනිමය අනුපාතිකයට අනුව අවශ්‍ය ව්‍යවහාර මුදල් අපවර්තනය කිරීම ද බැංකුවට කළ හැකි වේ.

**5. හානිපූරණය කිරීම**

යම් බැංකු ගිණුමක් හෝ ගිණුම් සම්බන්ධයෙන් බැංකුකරණ පහසුකම් සැපයීමට අදාළව කවර හෝ ආකාරයකින් පැන නගින්නා වූ හෝ පොදුවේ මේ නියමයන් හා කොන්දේසි සම්බන්ධයෙන් හෝ මේ නියමයන් හා කොන්දේසි බලාත්මක කිරීම මගින් බැංකුවට අයවිය යුතු මුදල් ප්‍රමාණ අයකර ගැනීමට අදාළව හෝ කවර හෝ ස්වභාවයක නීති කෘත්‍ය සම්බන්ධයෙන් සියලු පිරිවැය සහ වියදම් වලට (නෛතික ගාස්තු ද ඇතුළුව) එරෙහිව බැංකුව පූර්ණ වශයෙන් හානිපූරණය කිරීමට මම මෙයින් එකඟ වෙමි.

**6. අත්හැරීම**

යම් විශේෂ අවස්ථාවක් හෝ සිදුවීමක් හෝ සම්බන්ධයෙන් බැංකුව විසින් මේ නියමයන් හා කොන්දේසි වලින් වැළකී සිටීම, නොසැළකිලිමත් වීම හෝ අත්හැරීම මගින් ඒවා නැවත වරක් තදින් බලාත්මක කිරීමට බැංකුවට ඇති අයිතියට අගතියක් නොසිදු විය යුතුය. බැංකුව විසින් කරනු ලබන අත්හැරීමක්, එය ලිඛිත වූයේ නම් මිස බලාත්මක නොවන්නේය.

**7. පාලනය වන්නේ කවර නීතියකින්ද යන වග**

මේ නියමයන් සහ කොන්දේසි ශ්‍රී ලංකාවේ නීතියට අනුකූලව පාලනය වනු ලැබිය යුතු අතර ඒ අනුව තේරුම් ගත යුතුය. තවද, ශ්‍රී ලංකාවේ අනන්‍ය අධිකරණ බලයට අවලංගු කළ නොහැකි ලෙස මෙයින් නතු කරනු ලැබේ.

2006 අංක 05 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සහ 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත මගින් බැංකුව පාලනය වන බවත් නියාමන/නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය විසින් නියම කර ඇති පරිදි සැක කටයුතු ක්‍රියාකාරකම් සහ සීමාව ඉක්මවා ඇති ගනුදෙනු පිළිබඳ තොරතුරු වාර්තා කිරීමට සහ ඉදිරිපත් කිරීමට බැංකුව බැඳී සිටින බවත් සමාගම වැඩිදුරටත් පිළිගනී.

**8. දැන්වීම්**

මෙකී නියමයන් හා කොන්දේසි මගින් අන්‍යාකාරයෙන් සලසන්නේ නම් මිස, මේ නියමයන් හා කොන්දේසි යටතේ හෝ යම් බැංකු පහසුකමක් සඳහා වූ ඉල්ලීමකට තදනන්තරව බැංකුව විසින් කරනු ලබන යම් ඉල්ලීමක් හෝ සන්නිවේදනයක් ලිඛිත විය යුතු අතර, අදාළ ඉල්ලුම්පත්‍රයට මා විසින් දෙනු ලැබ ඇති ලිපිනයට ඒවා යැවිය යුතු අතර (හෝ මා විසින් කලින් කල බැංකුවට දෙනු ලබන වෙනත් ලිපිනයකට) තැපැල් කරන්නේ නම් තැපැල් කල දිනයේදී මා වෙත භාර දෙනු ලැබූ ලෙස සැළකිය යුතුය.

ගිණුම් ක්‍රියාකාරකම් සම්බන්ධ අදහස්, පැමිණිලි  යොමු කළ හැකි වන්නේ ඃ

ජ්‍යෙෂ්ඨ කළමනාකරු
පාරිභෝගික අත්දැකීම් කළමනාකරණ ඒකකය
සෙලාන් බැංකුව
04 වන මහල,
අංකඃ 90, ගාලු පාර
කොළඹ 03

දුරකථන අංකඃ 0112456981, 0112456982 හෝ 24X7 ක්ෂණික ඇමතුම් ඃ 0112008888
විද්‍යුත් තැපැලඃ customer.experience@seylan.lk